# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,993 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1260 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1271 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 1273 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1279 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) කෙටුම්පත 2016 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) **මහීපාල හේරත් ජන සහන පදනම (සංස්ථාගත කිරීමේ)** පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) සරවනපවන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 දෙසැම්බර් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 නොවැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1259 – B 081114—403 (2016/11)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 1219

MOD/DEF/2/01/ARF/RET/798.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 අප්‍රේල් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් තිස්ස නිමල් ජයසූරිය, යූඑස්පී, එච්ඩීඑම්සී (නි/60076)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 අප්‍රේල් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් තිස්ස නිමල් ජයසූරිය, යූඑස්පී, එච්ඩීඑම්සී (නි/60076)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 436

2016 අංක 1220

MOD/DEF/2/01/ARF/RET/1269.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 දෙසැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් උභය අනිල් බණ්ඩාර මැදවල, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී (නි/60017)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 දෙසැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් උභය අනිල් බණ්ඩාර මැදවල, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී (නි/60017)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

11 - 499

2016 අංක 1221

MOD/DEF/02/01/RET/968A.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 දෙසැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ ස්ථිර බල හමුදවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් නානායක්කාර ආගරගේ ජගත් චූලනාග ඩයස්, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී (නි/50991)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 දෙසැම්බර් මස 26 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය (පොදු) උපසේවයට

මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ජෙනරාල් නානායක්කාර ආගරගේ ජගත් චූලනාග ඩයස්, ඩබ්ඩබ්වී, ආර්ඩබ්පී, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී (නි/50991)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

11 - 437

---

2016 අංක 1222

MOD/DEF/2/01/ARF/RET/365.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 මැයි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් සනත් ජාලිය වික්‍රමසිංහ, යූඑස්පී (නි/60334)

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2013 මැයි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් සනත් ජාලිය වික්‍රමසිංහ, යූඑස්පී (නි/60334)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජී. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 නොවැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

11 - 435

2016 අංක 1223

MOD/DEF/2/01/ARF/RET/495.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 පෙබරවාරි මස 26 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් දපන කුරුප්පු ආරච්චි පියසේන, ආර්එස්පී, යූඑස්පී (නි/60520)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2014 පෙබරවාරි මස 27 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් දපන කුරුප්පු ආරච්චි පියසේන, ආර්එස්පී, යූඑස්පී (නි/60520)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

11 - 434

---

2016 අංක 1224

MOD/DEF/2/01/ARF/RET/781.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2015 මාර්තු මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් සියඹලාගහ කුඹුරෙ ගෙදර නවරත්න බණ්ඩාර ඇහැලමල්පේ, ආර්එස්පී (නි/60526)

**නිත්‍ය (පොදු) උප සේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2015 මාර්තු මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් සියඹලාගහ කුඹුරෙ ගෙදර නවරත්න බණ්ඩාර ඇහැලමල්පේ, ආර්එස්පී (නි/60526)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 463

---

2016 අංක 1225

MOD/DEF/2/01/ARF/RET/910.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2015 සැප්තැම්බර් මස 19 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කර්නල් කග්ගොඩ තන්ත්‍රිගේ සුජීව සිරිමෙවන් ගුණවර්ධන, ආර්එස්පී, අයිජී (නි/60434)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2015 සැප්තැම්බර් මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් කග්ගොඩ තන්ත්‍රිගේ සුජීව සිරිමෙවන් ගුණවර්ධන, ආර්එස්පී, අයිජී (නි/60434)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

11 - 448

---

2016 අංක 1226

MOD/DEF/02/01/RET/999.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 ජනවාරි මස 21 වැනි දින සිට බ්‍රිගේඩියර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික බ්‍රිගේඩියර් ප්‍රැන්සිස්කු ලමාහේවගේ තීක්ෂන ප්‍රියංගන ජයවර්ධන (නි/60199)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 ජනවාරි මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

බ්‍රිගේඩියර් ප්‍රැන්සිස්කු ලමාහේවගේ තීක්ෂන ප්‍රියංගන ජයවර්ධන (නි/60199)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

11 - 431

---

MOD/DEF/2/01/ARF/RET/1028.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
විශ්‍රාම ගැනීම අවලංගු කිරීම හා විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීම අවලංගු කිරීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2016 ජනවාරි මස 01 වැනි දින සිට විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අවලංගු කර ඇත.

ලුතිනන් කර්නල් මැද්දුම පටබැඳිගේ ආසිරි ඉඳුනිල්, යූඑස්පී, ශ්‍රීලංසිරෙ (නි/60684)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරි 2016 ජනවාරි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කර්නල් මැද්දුම පටබැඳිගේ ආසිරි ඉඳුනිල්, යූඑස්පී, ශ්‍රීලංසිරෙ (නි/60684)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ඔක්තෝබර් මස 19 වැනි දින,
කොළඹ දී ය.

11 - 462

---

2016 අංක 1227

MOD/DEF/2/01/ARF/RET/865.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) තංගවේලු සෞන්දරාජා, යූඑස්පී, ශ්‍රීලංඉ (නි/64378)

**නිත්‍ය (පොදු) උප සේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) තංගවේලු සෞන්දරාජා, යූඑස්පී, ශ්‍රීලංඉ (නි/64378)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

11 - 460

---

2016 අංක 1228

MOD/DEF/2/01/ARF/REM/655.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 අප්‍රේල් මස 20 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් මාලිම ගමගේ සිරිල් ප්‍රනාන්දු, යූඑස්පී, විපාරෙ (නි/63609)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 අප්‍රේල් මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් මාලිම ගමගේ සිරිල් ප්‍රනාන්දු, යූඑස්පී, විපාරෙ (නි/63609)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

11 - 432

---

2016 අංක 1229

MOD/DEF/2/01/ARF/REM/768.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 ඔක්තෝබර් මස 31 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් වාසලමුණි ආරච්චිලාගේ අරුණ ශ්‍රී උපුල් සංජීව, ආර්ඩබ්පී, කරෙ (නි/66083)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 නොවැම්බර් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් වාසලමුණි ආරච්චිලාගේ අරුණ ශ්‍රී උපුල් සංජීව, ආර්ඩබ්පී, කරෙ (නි/66083)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 447

---

2016 අංක 1230

MOD/DEF/2/01/ARF/REM/807.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2014 දෙසැම්බර් මස 19 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ගමආරච්චිගේ කුසුම්සිරි ජයලත් ගමආරච්චි, ආර්එස්පී, කරෙ (නි/63006)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 මාර්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

11 - 454

---

2016 අංක 1231

MOD/DEF/2/01/ARF/RET/743.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 පෙබරවාරි මස 05 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් ගමගේ රවිද් චාමින්ද රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, විපාරෙ (නි/62472)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 පෙබරවාරි මස 06 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් ගමගේ රවිද් චාමින්ද රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, විපාරෙ (නි/62472)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

11 - 452

---

2016 අංක 1232

MOD/DEF/2/01/ARF/RET/790.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

## අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මාර්තු මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් රණසිංහ මුදියන්සේලාගේ ඉන්දික නලින් බණ්ඩාර, ශ්‍රීලංසංබ (නි/65154)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මාර්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් රණසිංහ මුදියන්සේලාගේ ඉන්දික නලින් බණ්ඩාර, ශ්‍රීලංසංබ (නි/65154)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

11 - 430

---

2016 අංක 1233

MOD/DEF/2/01/ARF/REM/913.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 අප්‍රේල් මස 24 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් හපුතන්තිරිගේ දෙන් දුමින්ද නාලක බොනිෆස් ජයසූරිය, ආර්ඩබ්පී, ආර්එස්පී, ගැහේබ (නි/66148)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 අප්‍රේල් මස 25 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හපුතන්තිරිගේ දෙන් දුමින්ද නාලක බොනිෆස් ජයසූරිය, ආර්ඩබ්පී, ආර්එස්පී, ගැහේබ (නි/66148)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

11 - 445

---

2016 අංක 1234

MOD/DEF/2/01/ARF/RET/772.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2015 අප්‍රේල් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් රණසිංහ මුදියන්සේලාගේ තරංගිකා ඉන්දීවරී ගුණතිලක, ශ්‍රීලයුකාබ (නි/65127)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරිණී 2015 අප්‍රේල් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් රණසිංහ මුදියන්සේලාගේ තරංගිකා ඉන්දීවරී ගුණතිලක, ශ්‍රීලයුකාබ (නි/65127)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 443

---

2016 අංක 1235

MOD/DEF/2/01/ARF/RET/794.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මැයි මස 07 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් කුරුප්පු ආරච්චිගේ තුෂාර, ශ්‍රීලයුයුබ (නි/64193)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 මැයි මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් කුරුප්පු ආරච්චිගේ තුෂාර, ශ්‍රීලයුයුබ (නි/64193)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 446

---

2016 අංක 1236

MOD/DEF/2/01/RET/983.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් හේරත් මුදියන්සේලාගේ තිස්ස විජේරත්න, ශ්‍රීලපාහ (නි/63678)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් හේරත් මුදියන්සේලාගේ තිස්ස විජේරත්න, ශ්‍රීලපාහ (නි/63678)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

11 - 451

2016 අංක 1237

MOD/DEF/02/01/RET/994.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් මානික්කු වඩුගේ සමන්ත ප්‍රේමලාල්, ගරෙ (නි/65733)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් මානික්කු වඩුගේ සමන්ත ප්‍රේමලාල්, ගරෙ (නි/65733)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11 - 433

---

2016 අංක 1238

MOD/DEF/2/01/ARF/RET/918.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 12 වැනි දින සිට මේජර් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් තෙල්දෙණියේ පුරණ්කුඹුරේ හේමන්ත කුමාර, ගැහේබ (නි/63841)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් තෙල්දෙණියේ පුරණකුඹුරේ හේමන්ත කුමාර, ගැහේබ (නි/63841)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

11 - 442

---

2016 අංක 1239

MOD/DEF/2/01/ARF/RET/919.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 12 වැනි දින සිට මේජර් නිලයට නිල උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතාන් සේනාධීර පතිරැන්නැහේලාගේ සමන්ත වික්‍රමසිංහ, ශ්‍රීලයුයුබ (නි/64940)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 13 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් සේනාධීර පතිරැන්නැහේලාගේ සමන්ත වික්‍රමසිංහ, ශ්‍රීලයුයුබ (නි/64940)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

11 - 444

---

2016 අංක 1240

MOD/DEF/02/01/RET/995.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් රත්නායක මුදියන්සේලාගේ ජිනේශ් චමින්ද කුමාර මඩවල, ආර්එස්පී, ගරෙ (නි/66014)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ඔක්තෝබර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් රත්නායක මුදියන්සේලාගේ ජිනේශ් චමින්ද කුමාර මඩවල, ආර්එස්පී, ගරෙ (නි/66014)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11 - 449

---

2016 අංක 1241

MOD/DEF/2/01/ARF/RET/939.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 දෙසැම්බර් මස 07 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් කෝකිල ගැමුණු බණ්ඩාර තෙන්නකෝන්, ශ්‍රීලංසිරෙ (නි/63245)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 දෙසැම්බර් මස 08 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් කෝකිල ගැමුණු බණ්ඩාර තෙන්නකෝන්, ශ්‍රීලංසිරෙ (නි/63245)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

11 - 450

---

2016 අංක 1242

MOD/DEF/2/01/ARF/RET/717.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

**නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2015 පෙබරවාරි මස 14 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් (උපකරණ පාලක) හඳුන්නෙත්තිගේ මහින්ද, ශ්‍රීලපාහ (නි/63776)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 - 427

MOD/DEF/2/01/ARF/RET/680.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල පහත හෙළීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 ඔක්තෝබර් මස 09 වැනි දින සිට කපිතන් නිලයට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තාවකාලික මේජර් කුරුකුලසූරිය පටබැඳිගේ කුෂාන් මධුශංක ප්‍රනාන්දු, ශ්‍රීලංසංබ (නි/66111)

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරී 2014 ඔක්තෝබර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

කපිතන් කුරුකුලසූරිය පටබැඳිගේ කුෂාන් මධුශංක ප්‍රනාන්දු, ශ්‍රීලංසංබ (නි/66111)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

11 - 459

---

2016 අංක 1243

MOD/DEF/2/01/ARF/RES/891.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2015 ඔක්තෝබර් මස 01 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

තපිතන් අසිෆ් මොහමඩ් ෆාරුක්, ශ්‍රීලයුවෛබ (නි/69426)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

11 - 458

2016 අංක 1244

MOD/DEF/2/01/ARF/RET/513.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් (උපකරණ පාලක) තැන්නේ ගෙදර නිලන්ත ජයකොඩි, ශ්‍රීලංසිරෙ (නි/67051)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

11 - 428

---

2016 අංක 1245

MOD/DEF/2/01/ARF/REM/499.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ජූලි මස 18 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් බස්නායක මුදියන්සේලාගේ වත්තේ ගෙදර විජේකුමාර බංඩාර, ශ්‍රීලපාහ (නි/66843)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

11 - 455

---

2016 අංක 1246

MOD/DEF/2/01/ARF/REM/500.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් ලියන පතිරන්නැහැලාගේ නිශාන්ත සමන් කුමාර, විපාරෙ (නි/67432)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

11 - 440

---

2016 අංක 1247

MOD/DEF/2/01/ARF/REM/658.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීමක්

**විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරි 2013 ඔක්තෝබර් මස 27 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කරුණාපතිරණගේ අචිර රසාංජන ඩයස්, ආර්එස්පී, ගැහේබ (නි/62810)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

11 - 429

MOD/DEF/02/01/ARF/CAS/587.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2014 මාර්තු මස 06 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් හේරත් මුදියන්සේලාගේ ඉන්දික බණ්ඩාර රණතුංග, ශ්‍රීලවියාඉ (නි/68283)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මැයි මස 05 වැනි දින,
කොළඹ දී ය.

11 - 439

---

MOD/DEF/2/01/ARF/DIS/917.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
වෛද්‍ය හේතූන් මත අස් කිරීමක්

**අස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරි 2015 ජූනි මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත අස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් විදාන දිසාආරච්චි නිරෝෂ් ලක්මාල් ආරියවංශ, ශ්‍රීලවියාඉ (නි/68641)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 අගෝස්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

11 - 438

---

2016 අංක 1248

MOD/DEF/2/01/ARF/CAS/786.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරි 2014 දෙසැම්බර් මස 14 වැනි දින සිට අපකීර්ති සහගත ලෙස සේවයෙන් පහ කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිනන් කිරිනැලිය ගමගේ ගමිඳු කල්සිරි, ඉසේබ (නි/68947)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

11 - 457

---

MOD/DEF/2/01/ARF/CW/777.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද
අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරි 2013 මාර්තු මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

දෙවන ලුතිනන් දිනේෂ් විජේනායක වීරරත්න ආරච්චිගේ දිමන්ත පුෂ්පකුමාර වීරරත්න, ගැහේබ (නි/64018)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

බී එම් යූ ඩී බස්නායක,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2015 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ දී ය.

11 - 456

MOD/DEF/2/01/ARF/CW/479.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

**අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්**

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් පහත නම සඳහන් නිලධාරී 2013 නොවැම්බර් මස 30 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

දෙවන ලුතිනන් නිරංග ලක්ෂිත හෙන්දවිතාරණ, ශ්‍රීලපාහ (නි/68157)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

11 - 461

2016 අංක 1249

DLVF/RECT/81-11/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව**

**අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්**

පහත නම් සඳහන් මහත්වරුන් ඔවුන්ගේ නමට ඉදිරියෙන් සඳහන් කර ඇති දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාව වෙත ඉඳුරාම බඳවාගෙන ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

1. කෙඩෙට් නිලධාරී මැස්ටියගේ දොන් අතුල සේනක ගුණතිලක - 2012.12.07
2. කෙඩෙට් නිලධාරී රස්නෙකරාලලාගේ අමිල සංජීව රත්නායක - 2013.04.01

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2014 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දී ය.

11 - 570

# අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 1250

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ලොකු හැන්නදිගේ තිලකරත්න මහතා 2016 පෙබරවාරි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු ආයුර්වේද කොමසාරිස් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/1

2016 අංක 1251

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ටී. පී. ජේ. ශාක්‍ය නානායක්කාර මහතා 2016 අප්‍රේල් මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොන්ත්‍රාත් පදනම මත, නැවත නියමයක් කරනතුරු රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/2

2016 අංක 1252

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ජේ. ක්‍රිෂ්ණමූර්ති මහත්මිය 2016 මැයි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ආහාර කොමසාරිස් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/3

2016 අංක 1253

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

රංග කලන්සූරිය මහතා 2016 ජුනි මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/4

2016 අංක 1254

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ ඩබ්ලිව් එස්. කේ. පතිරත්න මහතා 2016 ජුනි මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/5

2016 අංක 1255

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩී. එල්. පී. ආර්. අභයරත්න මහතා 2013 ජූලි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු තැපැල්පති වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/6

2016 අංක 1256

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. ඊ. ආර්. ටී. එම්. එස්. පී. බණ්ඩාර මහතා 2016 ජූලි මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/7

2016 අංක 1257

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. පී. ජයතුංග මහත්මිය 2016 සැප්තැම්බර් මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/8

2016 අංක 1258

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජේ. එම්. මංගලතිස්ස මහතා 2016 සැප්තැම්බර් මස 20 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/9

2016 අංක 1259

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ජයන්ති විජේතුංග මහත්මිය 2016 සැප්තැම්බර් මස 21 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/10

---

2016 අංක 1260

**අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ**

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ පී. චන්දිමා දිල්රුක්ෂි සිගේරා මහත්මිය 2016 සැප්තැම්බර් මස 22 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

සුමිත් අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

11 - 596/11

---

## රජයේ නිවේදන

*මාගේ යොමු අංක* ඊඩී/1/8/9/මා/21

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26,27 සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ),(ඇ),(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මාතලේ දිස්ත්‍රික්කයේ කොටුවේගෙදර ශ්‍රී ධර්මදූත මෛත්‍රී විහාරයේ පිහිටි මා/ශ්‍රී විද්‍යාචන්ද්‍ර මූලික පිරිවෙණ 2015.09.16 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය කිරිබත්ගල්ලේ චන්දානන්ද ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙණ විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්.එස් .හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්.

2016 සැප්තැම්බර් මස 30 දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11 - 487

මාගේ යොමු අංක රීඩී/1/8/6/කුලි /23.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26,27 සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ),(ඇ),(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය, වීරපොකුණ, ඉහළකරඹේ ශ්‍රී ස්වර්ණතිලකාරාම මහා විහාරස්ථානයේ පිහිටි කුලි/සිරි මයුරපාද ද්වීභාෂා මූලික පිරිවෙණ 2016.04.08 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය බණ්ඩාරිගල්ගොඩ විසුද්ධිරතන ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙණ විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එස්. හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11 - 488

---

මාගේ යොමු අංක රීඩී/1/8/6/නික/24.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ, 26,27 සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ),(ඇ),(ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, සමදරාපිටිය ශ්‍රී පාලිත මහ පිරිවෙන් විහාරස්ථානයේ පිහිටි නික/ශ්‍රී පාලිත මූලික පිරිවෙණ 2016.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය ගලපිටියාගම විමලධම්ම ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙණ විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03 (06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. එස්. හෙට්ටිආරච්චි,
අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්.

2016 සැප්තැම්බර් මස 30 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11 - 489

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

1965 අංක 3 දරන ලංකා දුම්රිය සේවක යහසාධක සංගම් පනතේ 18:A ප්‍රකාර ව්‍යවස්ථා සංශෝධනය කිරීම

යථෝක්ත පනතේ 18:A ප්‍රකාර ලංකා දුම්රිය සේවක යහසාධක සංගමයේ 2016.03.20 වැනි දින පවත්වන ලද 44 වන සංවත්සරය සහ 45 වැනි නිලවරණයේදී සභා සම්මත වූ ව්‍යවස්ථා සංශෝධන හා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ ලේකම්ගේ අංක MT/03/05/21/17-1 හා 2016.08.31 දිනැති ලිපියෙන් ලැබී ඇති අනුමැතිය අනුව ව්‍යවස්ථා මාලාවේ පහත සඳහන් ඡේද සංශෝධනය කරනු ලැබේ.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 3:5 වගන්තිය

"සාමාජිකයෙකුගේ වැටුප්පතින් රු. 5ක් වූ මුදලක් ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් සංගමයට අය කරනු ලැබේ" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 3:5 වගන්තිය

"සාමාජිකයෙකුගේ වැටුප්පතින් රු. 100ක් වූ මුදලක් ඇතුළත්වීමේ ගාස්තු වශයෙන් සංගමයට අය කරනු ලැබේ" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 3:6:අ වගන්තිය

"සෑම සාමාජිකයෙකුම රු. 50ක් වූ මාසික සාමාජික මුදලක් ගෙවිය යුතුය. වර්ෂය අවසානයේ ගිණුමේ සඳහන් ශේෂයට වාර්ෂිකව 10%ක පොළී ප්‍රතිශතයක් ගිණුමට එක් කළ යුතු ය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 3:6:අ වගන්තිය

"සෑම සාමාජිකයෙකුම රු. 500ක් වූ මාසික සාමාජික මුදලක් ගෙවිය යුතුය. වාර්ෂිකව 10%ක පොළී ප්‍රතිශතයක් ගිණුමේ සඳහන් ශේෂයට වාර්ෂිකව ගණනය කොට එම පොළී ප්‍රමාණය සෑම වර්ෂයක් අවසානයේම වෙනම ගිණුමකට මාරු කර පවත්වාගෙන යා යුතුය. එය විශ්‍රාම යාමේදී විශ්‍රාම පාරිතෝෂිකයට එකතු කොට ලබා දිය යුතු ය." යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 9:6 වගන්තිය

"සේවය තහනම් කර ඇති අයෙකු, නිලධාරියෙකු හෝ ක්‍රියාකාරක මණ්ඩලයේ සභිකයකු ලෙසින් තෝරා නොගත යුතු ය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 9.:6 වගන්තිය

"සේවය තහනම් කර ඇති අයෙකු නිලධාරියෙකු හෝ ක්‍රියාකාරක මණ්ඩලයේ සභිකයෙකු ලෙසින් තෝරා නොගත යුතුය. නිලධාරීන් සහ ක්‍රියාකාරක මණ්ඩලයේ ඕනෑම නිලයක් වෙනුවෙන් අයදුම් කරනු ලබන සාමාජිකයෙක් අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන දිනය වන විට ආසන්න මාස 06කට නොඅඩු කාල සීමාවක් තුළ ඔහුගේ වැටුප්පතින් හා අවකරණ මගින් අදාළ මුදල් සංගමය වෙත අය වූ සක්‍රීය සාමාජිකයෙකු විය යුතු ය" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 14.:4 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලයෙන් සහ දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගෙන් කලින් ලබා ගත් අනුමැතියක් ඇතොත් මිස කිසිදු අවස්ථාවක චෙක්පත් වෙනුවෙන් අත්සන් තබන නිලධාරීන් විසින් රුපියල් පනස් දහසක (රු. 50,000) වැඩි මුදලකට චෙක්පත් නිකුත් නොකළ යුතු ය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 14:4 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලයේ සහ දුම්රිය සාමාන්‍යාධිකාරී තැනගෙන් කලින් ලබා ගත් අනුමැතියක් ඇතොත් මිස කිසිදු අවස්ථාවක සංගමයේ ගෙවීම් කරනු ලබන මුදල් විශ්‍රාම පාරිතෝෂික, විශ්‍රාම ප්‍රතිලාභ, මරණාධාර පාරිතෝෂික, විදුලි බිල්පත්, ජල බිල්පත් ආදී එදිනෙද ගෙවීම් ආයතනික ප්‍රතිසංස්කරණ සහ ඉදිකිරීම්වලට අමතරව විශේෂිත ගෙවීම් සඳහා අත්සන් තබන චෙක්පත් වෙනුවෙන් රුපියල් එකසිය දහසක (රු. 100,000)ට වැඩි මුදලකට චෙක්පත් නිකුත් නොකළ යුතුය" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 14:5 වගන්තිය

"විවිධ වියදම් සඳහා සංගමයේ මුදලින් රුපියල් දෙදහසකට (රු. 2,000) නොවැඩි මුදලක් ලේකම්/භාණ්ඩාගාරිකට තමා ළඟ තබා ගැනීමේ බලය තිබිය යුතුය. ගෙවන ලද සෑම මුදලක්ම වෙනුවෙන්ම රිසිට්පත් සහ කුවිතාන්සි ක්‍රියාකාරක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස යථා පරිදි ඉදිරිපත් කළ යුතු ය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 14:5 වගන්තිය

"විවිධ වියදම් සඳහා සංගමයේ මුදලින් රුපියල් දසදහසකට (රු. 10,000) නොවැඩි මුදලක් ලේකම්/භාණ්ඩාගාරිකට තමා ළඟ තබා ගැනීමේ බලය තිබිය යුතුය. ගෙවන ලද සෑම මුදලක් වෙනුවෙන්ම රිසිට්පත් සහ කුවිතාන්සි ක්‍රියාකාරක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස යථා පරිදි ඉදිරිපත් කළ යුතුය" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 17:4 වගන්තිය

"සාමාජිකයාට ලැබෙන මරණාධාර මුදල රු. 25,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමි පුරුෂයාගේ අභාවයකදී රු. 20,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ මව/පියා සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳගේ ස්වාමි පුරුෂයාගේ මව/පියාගේ අභාවයකදී රු. 15,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ අවිවාහක දරුවකුගේ මරණයකදී රු. 15,000ක මරණාධාර මුදලක් ගෙවනු ලැබේ. සාමාජිකයාට/සාමාජිකාවකට මරණාධාර මුදල් ලබා ගත හැක්කේ උපරිම වශයෙන් අවස්ථා තුනකදී පමණි. යම්කිසි සාමාජිකයකු/සාමාජිකාවක තමන් විශ්‍රාම යන අවස්ථාව තෙක් කිසිම මරණාධාර මුදලක් ලබා නොගත්තේ නම් ඔහු හෝ ඇය විශ්‍රාම යන අවස්ථාවේ සංගමය සතු ඔහුගේ/ඇයගේ තැන්පත් මුදල් ගෙවන විට ඔහුට හෝ ඇයට හිමි සම්පූර්ණ මරණාධාර මුදල ද තැන්පතුවට එකතු කොට ගෙවිය යුතුය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 17:4 වගන්තිය

"සාමාජිකයාට ලැබෙන මරණාධාර මුදල රු. 40,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමි පුරුෂයාගේ අභාවයකදී රු. 30,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ මව/පියා සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳගේ ස්වාමි පුරුෂයාගේ මව/පියාගේ අභාවයකදී රු. 25,000කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ අවිවාහක දරුවකුගේ මරණයකදී රු. 25,000ක මරණාධාර මුදලක් ගෙවනු ලැබේ. සාමාජිකයාට/සාමාජිකාවට මරණාධාර මුදල් ලබා ගත හැක්කේ උපරිම වශයෙන් අවස්ථා තුනකදී පමණි. යම්කිසි සාමාජිකයකු/සාමාජිකාවක තමන් විශ්‍රාම යන අවස්ථාව වන තෙක් කිසිම මරණාධාර මුදලක් ලබා නොගත්තේ නම් ඔහු හෝ ඇය විශ්‍රාම යන අවස්ථාවේ සංගමය සතු ඔහුගේ/ඇයගේ තැන්පත් මුදල ගෙවන විට හෝ ඔහුට හෝ ඇයට හිමි සම්පූර්ණ මරණාධාර මුදල ද තැන්පතුවට එකතු කොට ගෙවිය යුතුය. අවුරුදු 45-50 අතර සාමාජිකත්වය ලබා ගන්නා අයවලුන්ට සාමාජිකත්වය සඳහා වූ රු. 30,000ක මරණාධාර ප්‍රතිලාභයක් සහ සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමි පුරුෂයාගේ අභාවයකදී රු. 20,000ක යැපෙන්නන් සඳහා රු. 15,000ක ප්‍රතිලාභයක් හිමි වනු ඇත" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 18:17 වගන්තිය

"රුපියල් 20කට අඩු ගණනක් වෙනුවෙන් කිසිදු සාමාජිකයකුට ණය මුදල් අනුමත කරනු නොලැබේ" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 18:17 වගන්තිය

"රුපියල් එක් දහස් එකසිය විසිපහකට (රු. 1,125) අඩු ගණනක් වෙනුවෙන් කිසිදු සාමාජිකයකුට ණය මුදල් අනුමත කරනු නොලැබේ" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 23:5 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගිවන සෑම කාරක සභිකයකුටම රු. 50ක දීමනාවක් ගෙවිය යුතුය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 23:5 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගිවන සෑම විධායක සභිකයෙකුටම දිනකට රු. 200ක දීමනාවක් ගෙවිය යුතුය" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 23:6 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලය මගින් කැඳවනු ලබන සභා රැස්වීමක් සඳහා පැමිණෙන සෑම නියෝජිතයකුටම දිනකට රු. 50 බැගින් ඔහුගේ දුම්රිය ගමන් බලපත් ගාස්තුවට අමතරව ගෙවිය යුතුය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 23:6 වගන්තිය

"ක්‍රියාකාරක මණ්ඩලය මගින් කැඳවනු ලබන සභා රැස්වීමක් සඳහා පැමිණෙන සෑම නියෝජිතයකුටම දිනකට රු. 200 බැගින් ඔහුගේ දුම්රිය ගමන් බලපත් ගාස්තුවට අමතරව ගෙවිය යුතුය"

යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 26 වගන්තිය

"සෑම සාමාජිකයකු වෙතම ණය සටහන් පොතක් සහ සංගමයේ ව්‍යවස්ථා මාලාවේ පිටපතක් සපයනු ලැබේ. ණය සටහන් පොතෙහි සාමාජිකයාගේ ගිණුම ලෙජර් පොතෙහි සටහන්ව ඇති අයුරින් ඇතුළත් කොට දැක්විය යුතුය. ගිණුම් සටහන් ඇතුළත් කොට දැක්වීම පිණිස ණය සටහන් පොත මාස 06කට වරක් සංගමය වෙත එවිය යුතුය. ණය සටහන් පොතක් නැති වූ අවස්ථාවක අනු පිටපතක් නිකුත් කිරීමේ දී රු. 10ක මුදලක් අය කරනු ලැබේ. එම අනුපිටපතෙහි ලෙජර් පොතේ දක්වා ඇති අයුරින් ඉකුත් හය මාසයෙහි ගිණුම් ඇතුළත් කොට දැක්විය යුතුය" යන්න,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 26 වගන්තිය

"සෑම සාමාජිකයකු වෙතම ණය සටහන් පොතක් සහ සංගමයේ ව්‍යවස්ථා මාලාවේ පිටපතක් සපයනු ලැබේ. ණය සටහන් පොතෙහි සාමාජිකයාගේ ගිණුම ලෙජර් පොතෙහි සටහන්ව ඇති අයුරින් ඇතුළත් කොට දැක්විය යුතුය. ගිණුම් සටහන් ඇතුළත් කොට දැක්වීම පිණිස ණය සටහන් පොත මාස 06කට වරක් සංගමය වෙත එවිය යුතුය. ණය සටහන් පොතක් නැති වූ අවස්ථාවක අනු පිටපතක් නිකුත් කිරීමේදී රු. 100ක මුදලක් අය කරනු ලැබේ. එම අනුපිටපතෙහි ලෙජර් පොතෙහි දක්වා ඇති අයුරින් ඉකුත් හය මසෙහි (06) ගිණුම් ඇතුළත් කොට දැක්විය යුතුය" යනුවෙන් සංශෝධනය කිරීම.

වර්තමාන ව්‍යවස්ථාවේ අංක 33 වගන්තිය

"සංගමයේ සාමාජික අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා අවශ්‍යයැයි හැගෙන අවස්ථාවක සංගමයේ ගිණුම් පවත්වාගෙන යන බැංකුවෙන්/බැංකුවලින් මුදලක් අයදුම් කිරීමට ක්‍රියාකාරක මණ්ඩලයට බලය ඇත" යනුවෙන් සංශෝධනය කිරීම,

ව්‍යවස්ථාවේ සංශෝධිත අංක 33 වගන්තිය

"සංගමයේ සාමාජික අවශ්‍යතාවයක් සපුරාලීම අවශ්‍යයැයි හැගෙන අවස්ථාවක සංගමයේ ගිණුම් පවත්වාගෙන යන බැංකුවෙන්/බැංකු වලට අමතරව වෙනත් වාණිජ බැංකුවකින් හෝ පිළිගත් මූල්‍ය ආයතනයකින් මුදලක් අයදුම් කිරීමට ක්‍රියාකාරක මණ්ඩලයට බලය ඇත" යනුවෙන් සංශෝධනය කිරීම.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

11 - 502

---

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

### රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ජනමාධ්‍යවේදී හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව උපදෙස් මාලාව

ශ්‍රී ලංකාවේ සිටින ජනමාධ්‍යවේදීන්ගේ රාජකාරි කටයුතු පහසු කර ගැනීම හා ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීම අරමුණු කරගනිමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලබයි. එහෙයින් මෙම හැඳුනුම්පත අත්‍යාවශ්‍යම ජනමාධ්‍යවේදීන්ට පමණක් ලබාදීම නිර්දේශ කිරීමට පියවර ගන්නා ලෙස සියලු මාධ්‍ය ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

02. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව මෙම කාර්යපටිපාටියේ ඇතුළත් කරුණු වලට අමතරව වැඩි විස්තර 1 ඇමුණුමේ සඳහන්ව ඇත. කරුණාකර ඒ පිළිබඳ අවධානය යොමු කරන මෙන් ඉල්ලමි.

03. මාධ්‍ය හැඳුනුම්පත්වල ආරක්ෂාව තහවුරු කිරීම හා එය අදාළ නොවන පුද්ගලයින් අතට පත්වීම වැළැක්වීම පිණිස පහත සඳහන් ක්‍රමවේදය අනුව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

**i.** *දේශීය මාධ්‍යවේදීන්*

පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනමින් හෝ මාස හයට වැඩි සේවා කාලයක් සේවයේ නියුතු මාධ්‍යවේදීන්,

**ii.** *ඡායාරූප මාධ්‍යවේදීන්*

පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනමින් හෝ මාස හයට වැඩි සේවා කාලයක් සේවයේ නියුතු ඡායාරූප මාධ්‍යවේදීන්,

**iii.** *වෙබ් අඩවි මාධ්‍යවේදීන්*

එක් පුද්ගලයකු හෝ සමාගමක් යටතේ වෙබ් අඩවි කිහිපයක් ලියාපදිංචි කර තිබෙන අවස්ථා වලදී එක් වෙබ් අඩවියකට පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කළ යුතුය.

වෙබ් අඩවියක් මාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීමට සුදුසුකම් ලැබීම පිණිස දිනපතා යාවත්කාලීන කරනු ලබන අවම වශයෙන් නොකඩවා මාස හයක් පවත්වාගෙන යන ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු මත පදනම් වූ වෙබ් අඩවියක් විය යුතු අතර එම අඩවිය ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබිය යුතුය. මීට අමතරව වෙබ් අඩවිවල 25% ක ප්‍රවෘත්ති පළ වී තිබේ නම් එක් භාෂාවකට හැඳුනුම්පත් 02 ක උපරිමයකට යටත්ව "වෙබ් මාධ්‍ය" හැඳුනුම්පත් නිකුත් කිරීම.

**iv.** *නිදහස් මාධ්‍යවේදීන්*

අඛණ්ඩව මාස හයක කාලයක් තුළ පිළිගත් මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍ය ආයතන සඳහා වැඩසටහන්/ලිපි 12කට නොඅඩු සංඛ්‍යාවක් ඉදිරිපත් කළ මාධ්‍යවේදීන් (එසේ පළවූ ප්‍රවෘත්ති ඉදිරිපත් කළ යුතුය)

**v.** *මාධ්‍ය පරිපාලකයන්*

පිළිගත් මාධ්‍ය ආයතනයක සේවයේ නියුතු මාධ්‍ය පරිපාලනයට සෘජුවම දායකවන මාධ්‍ය පරිපාලකයින්

මාධ්‍යවේදීන් 100-200 අතර සේවයේ නියුතු මාධ්‍ය ආයතන සඳහා හැඳුනුම්පත් 02
මාධ්‍යවේදීන් 200-300 අතර සේවයේ නියුතු මාධ්‍ය ආයතන සඳහා හැඳුනුම්පත් 04
මාධ්‍යවේදීන් 300ට වැඩියෙන් සේවයේ නියුතු මාධ්‍ය ආයතන සඳහා හැඳුනුම්පත් 05

**vi.** *ප්‍රාදේශීය මාධ්‍යවේදීන්*

- ජාතික තලයේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතනයකට අඛණ්ඩව මාස හයක් ප්‍රවෘත්ති වාර්තා කර ඇති බව

තහවුරු කර හැකි ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු ලෙස පත්කරනු ලැබ ඇති මාධ්‍යවේදීන්

**vii.** *මාධ්‍ය තාක්ෂණ ශිල්පීන්*

- පිළිගත් ජනමාධ්‍ය ආයතනයක සේවයේ නියුතු ප්‍රවෘත්ති හා/හෝ කාලීන මාධ්‍ය කටයුතු සඳහා ආයතනයෙන් බැහැරව යාමට සිදුවන මාධ්‍ය තාක්ෂණ නිලධාරීන් (විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය සඳහා)

**viii.** *විදේශීය මාධ්‍යවේදීන්*

**ස්ථිර** - විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකාවේ ශාඛාවන්හි හෝ විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකා නියෝජිතයන් ලෙස එම ආයතන විසින් පත්කරනු ලැබ සිටින ස්ථිර වශයෙන් සේවය කරන ජනමාධ්‍යවේදීන්

**තාවකාලික** - විශේෂ අවස්ථා ආවරණය කිරීම සහ වාර්තාමය වැඩසටහන් නිෂ්පාදනය සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවට පැමිණෙන මාධ්‍යවේදීන් (විශේෂ අවස්ථා රූගත කිරීමට පැමිණෙන අවස්ථාවන්හි ඒ සඳහා ශ්‍රී ලංකාවේ අදළ බලධාරින්ගේ පූර්ව අනුමැතිය ලබා සිටිය යුතුය)

04. මාධ්‍ය හැඳුනුම්පත් සඳහා ඉල්ලුම් කරන සෑම මාධ්‍යවේදියකුම තම මාධ්‍ය ආයතනය විසින් නිකුත් කරනලද හැඳුනුම්පතේ සහතික කළ ඡායා පිටපතක් හා පත්වීම් ලිපියේ පිටපතක් ලබාදීම අනිවාර්යවේ. සැලකිය යුතු පාඨකයන්/නරඹන්නන් සංඛ්‍යාවක් සහ අලෙවියක් ඇති විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය පිළිගත් මාධ්‍ය ලෙස සලකනු ලැබේ.

05. මේ සඳහා දෙපාර්තමේන්තුව විසින් සකස්කර ඇති අයදුම්පත පුරවා මුද්දර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් සහ මෙහි සඳහන්වන අනෙකුත් ලියකියවිලි සමග රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සෑම වසරකම මුල් මාස හය තුළ සිදුකරනු ලබන අතර විශේෂ අවශ්‍යතාවයන් මත සැප්තැම්බර් මස 30 දක්වා නිකුත් කරනු ලැබේ. නියමිත ලෙස ආකෘති පත්‍රය පුරවා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙසේ නමුත් මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ අවසාන තීරණය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතුය.

06. ඉහත 3 ඡේදයේ නියමයන්ට අනුකූලව ජාතික තලයේ මාධ්‍යවේදීන්ට වාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත හා ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ට දෙවසරකට වරක් අලුත් කිරීමේ පදනමින් ද මෙම හැඳුනුම්පත් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සන සහිතව නිකුත් කරනු ලැබේ. කෙසේ වෙතත් මෙම හැඳුනුම්පත් නිකුත් කිරීමට අදළව මාධ්‍ය ආයතන ප්‍රධානි හෝ ප්‍රධාන පරිපාලන නිලධාරි විසින් තම ආයතනයේ ප්‍රවෘත්ති හා කාලීන අංශවලට අදළ මාධ්‍යවේදීන්ගේ විස්තර ඇතුළත් නාම ලේඛනයක් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඔහුගේ පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

ආචාර්ය රංග කලන්සූරිය,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

11 - 508

ඇමුණුම

**<u>පොදු කොන්දේසි</u>**

01. මාසිකව මුද්‍රණය කරන පුවත්පත් / සඟරා වෙනුවෙන් උපරිම වශයෙන් මාධ්‍ය හැඳුනුම්පත් 3 ක් පමණක් ලබා දෙනු ලැබේ.

02. මාස දෙකකට වරක් මුද්‍රණය කරන පුවත්පත් / සඟරා වෙනුවෙන් උපරිම වශයෙන් මාධ්‍ය හැඳුනුම්පත් 2 ක් ලබා දෙනු ලැබේ.

කෙසේ වෙතත් ඉහත අංක 01 සහ 02 සඳහා අදළ මාධ්‍ය ආයතන වෙතින් තම ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන බව තහවුරු කරනු පිණිස මෑතක දී පිළිවෙලින් පළ කරන ලද පිටපත් 12 ක් ඉදිරිපත් කළ යුතුවේ.

03. යම්කිසි පුවත්පතක් සමග නිකුත් කරනු ලබන අතිරේකය වෙනම පුවත්පතක් ලෙස නොසැලකිය යුතු අතර එම අතිරේකය වෙනුවෙන් හැඳුනුම්පත් අයදුම් කරන මාධ්‍යවේදීන්හට අදාළ ප්‍රධාන පුවත්පතේ නමින්ම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කළ යුතුය.

04. එක් ක්ෂේත්‍රයකට පමණක් යොමු වූ පුවත්පත් වලට (දේශපාලන, ආගමික, කාන්තා පුවත්පත් වැනි) හැඳුනුම්පත් නිකුත් නොකළ යුතු නමුදු එවන් පුවත්පත් වල 25%ක ප්‍රමාණයක් ප්‍රවෘත්ති පළ කිරීමක් සිදුවන්නේ නම් පමණක් සීමිත ප්‍රමාණයකට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම. මේ සඳහා එම මාධ්‍යවේදීන්ගේ byline සමග පළ වූ ප්‍රවෘත්තිය නිර්ණායකයක් ලෙස සලකනු ලැබේ.

05. කිසියම් හෝ මාධ්‍ය ආයතනයක සේවයෙන් ඉවත් කරන / ඉවත්ව යනු ලබන මාධ්‍යවේදියකුගේ හැඳුනුම්පත නැවත ලබා ගෙන මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ආයතන ප්‍රධානියාගේ වගකීම වනු ඇත. එසේ නැවත භාර දීමකින් තොරව ඒ වෙනුවට වෙනත් හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

06. අස්ථානගත වූ හැඳුනුම්පතක් වෙනුවට නැවත හැඳුනුම්පතක් ලබා ගැනීමට නම් එම අස්ථානගතවීම පිළිබඳ පොලීසියේ පැමිණිලි කර පොලිස් වාර්තාවක් සහ ඔහු/ඇය සේවය කරන ආයතනයෙන් හැඳුනුම්පතක් නැවත ලබා දෙන ලෙස ද ඉල්ලීමක් කළ යුතුය.

07. ආගමික ආයතන සහ ඒ හා සමාන අනෙකුත් සංවිධාන සහ ආයතනවලින් ප්‍රසිද්ධ කරනු ලබන පුවත්පත් / සඟරා ආදිය එදිනෙද පවත්වන ප්‍රවෘත්ති සාකච්ඡාවන් සඳහා සහභාගී නොවන බැවින් එම ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනු නොලැබේ.

08. අනෙකුත් රාජ්‍ය ආයතනවලට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී එම අමාත්‍යාංශවලට අයත් මාධ්‍ය ඒකකවලට පමණක් සීමා කරනු ලැබේ.

ආචාර්ය රංග කලන්සූරිය,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/33/2016/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.11.11 වැනි දින සිට 2016.11.25 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.12.02 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

#### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වැල්ල දරන කොට්ඨාසයේ 57 වෙළුමේ 139, 140 පත්‍රිරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කිරුළපනේ පිහිටි 'පරවැටිය ඕවිට සහ මහලියද්දේ' නැමති ඉඩමේ අංක B4 දරන කැබැල්ලට බලයලත් මානක සී. ඩබ්. ද නීස් මහතා විසින් 1958.02.01 වැනි දින මැන සාදන ලද අංක 306 දරන පිඹුරට ප්‍රකාර මායිම්,<br><br>*උතුර* : රජයට වෙන් කළ බිම,<br>*නැගෙනහිර* : ලොට් B5,<br>*දකුණ* : පාර<br>*බස්නාහිර* : ලොට් B3.<br><br>*ප්‍රමාණය* : අ. 0, රූ. 0, පර්. 18.98 | 01. එම්. අයි. බී. ඉස්මයිල් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1964.04.02 වැනි දින අංක 173 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. ජේ. ඩබ්ලිව්. ඩී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1969.08.07 වැනි දින අංක 865 දරන විකුණුම් ඔප්පුව.<br><br>03. ජේ. ඩබ්ලිව්. ඩී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1971.08.16 වැනි දින අංක 1076 දරන විකුණුම් ඔප්පුව.<br><br>04. ඩබ්. එම්. එන්. ආර්. පී. වික්‍රමනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1989.01.25 වැනි දින අංක 17 දරන උකස් ඔප්පුව. |

11 - 539

**ඉඩම් මැනුම් සභාව**

ඉඩම් අමාත්‍යාංශය

**2002 අංක 17 දරන මැනුම් පනතේ 37 (ඊ) ඡේදය යටතේ ඉඩම් මැනීම පිළිබඳව ශාස්ත්‍රීය සහ වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවරුන් ලෙස ලියාපදිංචි වීමට සහ වෘත්තීමය මැනුම් කටයුතුවල යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සහ අළුත් කිරීම සඳහා වූ ඉල්ලුම්කරුවන්ට සුදුසුකම් ලබාගැනීම සඳහා විභාග සහ වෘත්තීයමය පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය**

2016.09.15 වැනි දිනැති අංක 1985 දරන *ගැසට් පත්‍රයේ* මවිසින් පළකරන ලද *ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරමි.

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2016ක් වූ ඔක්තොබර් මස 7 වැනි දින,
කොළඹ දී ය.

11 - 556

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - මාලඹේ ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියා පදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2016.09.06 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී , 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය ඃ 0670-01455340-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බියට්‍රිස් අමිතා රාජපක්ෂ අමරසේන විසින් සහතික කරන ලද 2005 අගෝස්තු මස 04 වැනි දිනැති අංක 190 සහ ප්‍රසිද්ධ නොතාරිස් රණතුංග සරත්චන්ද්‍ර කවිරාජ් විජයරත්න විසින් සහතික කරන ලද 2007 ජුලි මස 11 දිනැති අංක 1455 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාලඹේ පිහිටි ට්‍රාන්ස් වෝටර් ඉංජිනියරිං(පීවිටි) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් රුපියල් දෙකෝටි හැටනව ලක්ෂ පන්දහස් හයසිය හයයි ශත හතලිස් නවයක (රු. 26,905,606.49) මුදලක්, 2016 මැයි මස 11 වැනි දින වන විට එකී බැඳුම්කරය මත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී (රු. 26,905,606.49) 2016 පෙබරවාරි මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට දහ අට (18%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ප්‍රසිද්ධ නොතාරිස් එස්.කේ.තෙපුලන්ගොඩ විසින් සහතික කරන ලද 2013 අගෝස්තු මස 26 දිනැති අංක 1788 දරන නිදහස් කිරීමේ ඔප්පුවේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම නිදහස් කිරීමෙන් පසු ඉහතකී අංක 190 සහ 1455 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉතිරි දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිට කොරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ අංක 520 ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2009 ජුනි 23 දිනැති අංක 5257 සැලැස්මේ නිරූපනය වන කොස්වත්ත පාර, 1 පටු මග වරිපනම් අංක 25/2 දරන නාවල කුරුඳුවත්ත නැමැති ගොඩනැගිලි, ගස් , වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ 2 ලකුණු කල බෙදා

වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් ඒ 1 ද , නැගෙනහිරට : පාර ද, දකුණට : සැලී සහ ඉන්ද්‍රපාල විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 3 සහ රණවක විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී1 ද, බස්නාහිරට : රණවක විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 1 සහ ලොට් 2 යන මායිම් තුළ එකී අංක 5257 සැලැස්ම අනුව පර්චස් විසි නවයයි දශම හයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 29.63 ) ක් (හෙක්ටයාර් 0.0149) විශාල ඉඩම.

පහත සඳහන් පාර සඳහා වෙන්කිරීම තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. අහංගම විසින් සාදන ලද කොළඹ දිසා අධිකරණයේ අංක 13718පී නඩු වාර්තාවේ ගොනු කර ඇති 1977 සැප්තැම්බර් 18 දිනැති අංක 2135 සැලැස්මේ නිරූපනය වන නාවල කරුඳුවත්ත නමැති ඉඩමේ ලොට් 4 ලකුණු කළ (අඩි 10 ක් පළල පාර සඳහා වෙන්කිරීම) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම, උතුරට : අංක 2135 සැලැස්ම සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : බී. පී. ගජවීර විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් සී හි කොටස ද, දකුණට : කොස්වත්ත පාරට අඩි පාර සහ බස්නාහිරට : එකී අංක 2135 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 සහ 2 යන මායිම් තුළ එකී අංක 2135 සැලැස්ම අනුව පර්චස් පහක් (අ. 0, රූ. 0, පර්. 5) ක් විශාල, ඉඩම.

එකී ලොට් ඒ ලකුණු කළ ඉඩම් කොටස පහත සඳහන් පරිදි විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභා සීමාව තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු එච්.කේ.ගුණදාස විසින් සාදන ලද 2005 ජූලි 20 දිනැති අංක 2160 සැලැස්මේ නිරූපනය වන කොස්වත්ත පාර, 1 පටුමග වරිපනම් අංක 25/2 දරන නාවල කුරුඳුවත්ත නමැති ගොඩනැගිලි, ගස් ,වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඒ ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2135 දරන සැලැස්මේ ලොට් 2 ද, නැගෙනහිරට : අංක 2135 දරන සැලැස්මේ සඳහන් ලොට් 4, දැන් 1 පටුමග දැන් අඩි 10 ක් පළල පාර ද, දකුණට : සැලී සහ ඉන්ද්‍රපාල විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 3 සහ බස්නාහිරට : රණවක විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී1 සහ ලොට් 23 යන මායිම් තුළ එකී අංක 2160 සැලැස්ම අනුව රූඩ් එකක් ( අ. 0, රූ. 1, පර්. 0) විශාල ඉඩම.

එකී ලොට් ඒ ලකුණ කළ ඉඩම් කොටස පහත සඳහන් පරිදි විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ කෝට්ටේ නගර සභා සීමාව තුළ නාවල පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. අහංගම විසින් සාදන ලද කොළඹ දිසා අධිකරණයේ අංක13718 පී නඩු වාර්තාවේ ගොනු කර ඇති 1977 සැප්තැම්බර් 18 දිනැති අංක 2135 සැලැස්මේ නිරූපනය වන කොස්වත්ත පාර වරිපනම් අංක 79 දරන නාවල කුරුඳුවත්ත නමැති ගොඩනැගිලි, ගස් , වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 3 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2135 සැලැස්මේ සඳහන් ලොට් 2 ද, නැගෙනහිරට අංක 2135 සැලැස්මේ සඳහන් ලොට් 4 ද, දකුණට : සැලී සහ ඉන්ද්‍රපාල විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 3 හි කොටස සහ රණවක විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 1 සහ බස්නාහිරට : රණවක විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ ලොට් බී 1 සහ එකී අංක 2135 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 ද යන මායිම් තුළ එකී අංක 2135 සැලැස්ම අනුව රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) ක් විශාල, ඉඩම. මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2330/38 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ.හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිණී - නීති.

11 - 505

---

## සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.09.26 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 1030-33528193-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියා පදිංචි කර ඇත.) ප්‍රසිද්ධ නොතාරිස් ඈන් මෙලනි ඩී ලීමා විසින් සියල්ලම සහතික කරන ලද සියල්ලම 2014 ජූලි 03 දිනැති අංකː 1108, 1107, 1106, 1105, 1104, 1103, 1102, 1101, 1100 සහ 1099 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දඹුල්ල මෙසස් රන්ගිරි හි අධිපති වන ආරච්චිගේ ප්‍රියන්ත ප්‍රනාන්දු යන අය බන්ධනදයී වශයෙන් රුපියල් එක් කෝටි අසූහතර ලක්ෂ හතලිස් අට දහස් එකසිය හැත්තෑ තුනයි ශත හතලිස් හයක (රු. 1,84,48,173.46) මුදලක්, රුපියල් එක් කෝටි හැට හත්ලක්ෂ දහඅටදහක (රු. 16,718,000) මත වසරකට 15% බැගින් පොලියත් සමග මුදලක් වාර ණය පහසුකම වෙනුවෙන් 2016 අගෝස්තු මස 02 වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී මුළු මුදල වන රුපියල් එක් කෝටි අසූහතර ලක්ෂ හතලිස් අටදහස් එකසිය හැත්තෑ තුනයි ශත හතලිස් හයක (රු. 1,84,48,173.46) මුදලක් පෙරකී පොලිය සමග විකිණීමේ දිනය දක්වා කාලයට,

ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහතකී අංකඃ1108, 1107, 1106, 1105, 1104, 1103, 1102, 1101, 1100 සහ 1099 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමුවැනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2008.07.24 වැනි දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 21 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම සැලැස්මේ ලොට් 18 ද, නැගෙනහිරට : කළු බණ්ඩා ගේ ඉඩම ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 22 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කළ මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් පහලොවක් (අ. 0, රූ. 0, පර්. 15.0) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම,

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී. 33 / 57 හි ලියාපදිංචි කර ඇත.

ඉහතකී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමග.

### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2008.07.24 වැනි දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 18 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 17 ද, නැගෙනහිරට : කළු බණ්ඩා ගේ ඉඩම ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 21 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කළ මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 13.5) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමහ ඉඩම, මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී. 33 / 56 හි ලියා පදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමග.

### තුන්වෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2008.07.24 වැනි දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 17 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම සැලැස්මේ ලොට් 14 ද, නැගෙනහිරට : කළු බණ්ඩාගේ ඉඩම ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 18 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කළ මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12.0) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය මාතලේ ඉඩම ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී. 33/55 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුර කථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමග.

### හතරවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදනලද 2008.07.24 වැනි දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 14 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 12 ද, නැගෙනහිරට : කළු බණ්ඩාගේ ඉඩම ද, දකුණට : මෙම සැලැස්මේ ලොට් 17 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12.0) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය මාතලේ ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව සී. 33/54 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමග.

### පස්වෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2008.07.24 වැනි දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 11 ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 10 ද, නැගෙනහිරට : ලොට් 13 ලෙස ලකුණු කළ මීටර් 6 ක් පළල පාර ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 15 ද, බස්නාහිරට : විශ්වනාදන්, හේරත් හාමි සහ කීරාලගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12.0) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව සී. 33/53 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමග.

### හයවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදනලද 2008.07.24 දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 10 ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 07 ද, නැගෙනහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 11 ද, බස්නාහිරට : විශ්වනාදන්, හේරත් හාමි සහ කීරාල ගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් දෙළහ (අ. 0, රූ. 0, පර්. 12.0) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමඟ ඉඩම. මෙය මාතලේ ඉඩම ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී. 33/52 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමඟ.

### හත්වෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදන ලද 2008.07.24 දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 07 ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම සැලැස්මේ ලොට් 06 ද, නැගෙනහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 10 ද, බස්නාහිරට : විශ්වනාදන්, හේරත් හාමි සහ කීරාල ගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් දෙළහ (අ. 0, රූ. 0, පර්. 12.0) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාතලේ ඉඩම ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය / පත්‍රිරුව සී. 33/51 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංකඃ 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමඟ.

### අටවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදනලද 2008.07.24 දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 05 ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 04 ද, නැගෙනහිරට : ජයසිංහ ගේ ඉඩම ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 08 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් දෙළහ (අ. 0, රූ. 0, පර්. 12.0) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාතලේ ඉඩම ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී. 33/50 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමඟ.

### නවවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදනලද 2008.07.24 දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 04 ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම සැලැස්මේ ලොට් 01 ද, නැගෙනහිරට : ජයසිංහ ගේ ඉඩම ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 05 ද, බස්නාහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද, යන මායිම් තුළ පර්චස් දෙළහ (අ0 රූ0 පර් 12.0) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාතලේ ඉඩම ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී. 33/49 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුළ උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමඟ.

### දහවෙනි උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසිය පත්තුවේ, රත්මලගහ ඇල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. විජේතුංග විසින් සාදනලද 2008.07.24 දිනැති අංක 3842 දරන සැලැස්මේ නිරූපනය වන ලීනියාගොල්ලේයාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 03 ලකුණු කල බෙද වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම සැලැස්මේ ලොට් 02 ද, නැගෙනහිරට : ලොට් 13 ලෙස ලකුණු කල මීටර් 6 ක් පළල පාර ද , දකුණට : මෙම සැලැස්මේ ලොට් 06 ද, බස්නාහිරට : විශ්වනාදන් ගේ ඉඩම ද, යන මායිම් තුළ පර්චස් දෙළහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්.12.5) ක් විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මාතලේ ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව සී. 33 /48 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 3842 සැලැස්මේ නිරූපනය වන ලොට් 13 තුල උඩින් දිගේ පොදු මාර්ග අයිතිය සහ ප්‍රවේශ මාර්ගය සහ එය උඩින් දුරකථන කේබල්, විදුලි රැහැන් සහ ජල නල යෙදීමේ පොදු අයිතීන් ද සමඟ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෞශල්‍යා හැච් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති

11-506

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය- 1706732
හීන්කෙන්ද මුදලිගේ පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද *හෙවත්* හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද *හෙවත්* පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද තිලකරත්න ශ්‍රි ගාමිණී කරුණාතිලක.

2016 සැප්තැම්බර් මස 30 වන දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙලෙස නිශ්චය කරනු ලබයි.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් I. H. B. D. විජේකෝන් විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සහතික කරන ලද අංක 4368, 2011 ජුනි මස 22 වැනි දින සහතික කරන ලද අංක 4402 සහ 2014 පෙබරවාරි 26 වන දින සහතික කරන ලද අංක 4565 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දාවූද බැඳුම්කර (මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හීන්කෙන්ද මුදලිගේ පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද හෙවත් පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද හෙවත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පංජලි හීන්කෙන්ද සහ තිලකරත්න ශ්‍රි ගාමිණී කරුණාතිලක යන අය ණයකරුවන් හැටියටත් හීන්කෙන්ද මුදලිගේ පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද හෙවත් පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද හෙවත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් D. M. G. S. විජේසේකර විසින් 2014 මාර්තු මස 24 වැනි දින සහතික කරන ලද අංක 1602 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූද බැඳුම්කර (මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද සහ තිලකරත්න ශ්‍රි ගාමිණී කරුණාතිලක යන අය ණයකරුවන් හැටියටත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් I. H. B. D. විජේකෝන් විසින් 2014 මාර්තු මස 25 වැනි දින සහතික කරන ලද අංක 4566 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූද බැඳුම්කර (මෙහි තෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇති ඉඩම) යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද *හෙවත්* පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද සහ තිලකරත්න ශ්‍රි ගාමිණී කරුණාතිලක යන අය ණයකරුවන් හැටියටත් හීන්කෙන්ද මුදලිගේ දෝන පද්මා පුෂ්පාංජලි හීන්කෙන්ද *හෙවත්* පද්මා පුෂ්පාංජලී හීන්කෙන්ද උකස්කරු හැටියටත් පැහැර හැර ඇති හෙයින් ද,

එකී බැඳුම්කර යටතේ රුපියල් අසූදෙලක්ෂ හැත්තෑ අටදහස් එකසිය අනූහයයි ශත දාහත (රු. 82,78,196.17) ක මුදලක් 2016 අගෝස්තු මස 02 වැනි දින වන විට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රුපියල් අසූදෙලක්ෂ හැත්තෑ අටදහස් එකසිය අනූහයයි ශත දාහත (රු. 82,78,196.17)ක මුදල අයකර ගැනීම සඳහා සහ එකී රු. 7,908,880.14ක මුදල මත 2016 අගෝස්තු මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට 12% වැඩිවූර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 4368, 4402, 4565, 1602 සහ 4566 දරන බැඳුම්කරයන් යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හට උකස් කොට ඇත්තාවූද මෙහි පළවන දෙවන සහ තුන්වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තා වූද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩ්‍රොප් වීදියේ අංක 200 හි 2 වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුශ්‍රාලත් වෙන්දේසිකරු L. B. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, තවලංක්ඹය දිශාවේ අංක E 357 B දරණ ග්‍රාම නිලධාරි වසමේ උකුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු මාතලේ මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි උකුවෙලවත්ත (කොටසක්) නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු A. G. W. ගිරාගම විසින් 2006 දෙසැම්බර් 30 වන දින සාදන ලද අංක 6331 දරන පිඹුරේ ලොට් 2 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාරෙන් ද (අඩි 10ක් පළල), නැගෙනහිරට : මාතලේ ප්‍රධාන පාරේ සිට උකුවෙල දක්වා ද, දකුණට : උකුවෙල වත්ත කොටසෙන් ද සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 1 න්ද, මායිම් වූ එකී අංක 6331 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසය (අ. 0, රූ. 0, පර්. 16) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම ගොඩනැගිලි ගහකොළ වගාවන් සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/ පත් ඉරුව B 403/344 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ උකුවෙල E 355 දරන ග්‍රාම නිලධාරි වසමේ දකුණු මාතලේ මැදසිය පත්තුවේ, උකුවෙල පිහිටි උකුවෙලවත්ත නැමැති ඉඩමෙන් බෙදා වෙන්කොට ඇති ඉඩමට මාතලේ බලයලත් මිනින්දෝරු A. G. W. ගිරාගම විසින් 1991 සැප්තැම්බර් 07 වන දින මැන සාදන ලද අංක 2329/2 දරන පිඹුරට මායිම් වශයෙන් උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටසෙන් ද දකුණට : අඩි 10ක් පළල ප්‍රවේශවීමේ පාරෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමඟ වගාවන් සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමඟ වන මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ F 04/61 යටතේ ලියාපදිංචි කර ඇත.

### තෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, තවලංක්ඹය දිශාවේ අංක E 357 B දරන ග්‍රාම නිලධාරි වසමේ උකුවෙල ප්‍රාදේශීය සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු මාතලේ

මැදසිය පත්තුවේ උකුවෙල පිහිටි උකුවෙලවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු A. G. W. ගිරාගම විසින් 2006 දෙසැම්බර් මස 30 වැනි දින සාදන ලද අංක 6331 දරණ පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාරෙන් ද, නැගෙනහිරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 2න් ද, දකුණට : උකුවෙල වත්ත ඉතිරි කොටසෙන් ද සහ බස්නාහිරට : ඉහත සඳහන් ඉඩමේ ඉතිරි කොටසෙන් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සහ එහි පිහිටි අනෙකුත් සියලුදේත් සමඟ වන මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ F 23/103 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

11 - 544

---

## ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව - හම්බන්තොට ශාඛාව

### 1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වෙනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගණුදෙනුකරුගේ නම : විජේවීර ගුණරත්න මහවිදාන මුහන්දිරම්ගේ ජයන්ත මහතා.

දේපළ හිමි ලිපිනය : මිරිස්ස දකුණ, මිරිස්ස

සමාගම් ලියාපදිංචි අංක. පී.බී. 52 දරණ සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව නමින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් අනුෂා නිරංජලා ප්‍රනාන්දු යන අය විසින් ලියා සහතික කරන ලද 2012 අගෝස්තු 03 දාතම හා අංක. 1742 දරණ උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛණවල මැනවින් විස්තර කොට ඇති දේපළ ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසුගෙවීම විජේවීර ගුණරත්න මහවිදාන මුහන්දිරම්ගේ ජයන්ත යන අය බන්ධනදායින් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක. 1742 දරන බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් පනස් පන් ලක්ෂ විසි පන් දහස් අටසිය විසි නමයයි ශත විස්සක (රු. 5,525,829.20) මුදලක් 2015 මැයි 31 වැනි දිනට එකී සීමාසහිත ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව (මෙහි යම් තැන්හී "බැංකුව" යයි කියනු ලබන) වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, 2015 ජුනි 01 දින සිට අයවියයුතු මුළුමුදල සහ පොළිය පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් තුන් ලක්ෂ හැට තුන් දහසක (රු. 4,363,000.) මුදලක් සඳහා වාර්ෂිකව සියයට 16% බැගින් වූ පොළියද, අයවියයුතු හෙයින් ද,

පහත සඳහන් අයුරු යෝජනා සම්මත කරගන්නා ලදි :-

1. එකී රුපියල් පනස් පන් ලක්ෂ විසි පන් දහස් අටසිය විසි නමයයි ශත විස්සක (රු. 5,525,829.20) මුදල සහ පොළියද, සියළු පිරිවැයද, දරන්නට සිදුවූ වෙනත් වියදම්ද, අයකරගත හැකි සියළු මුදල්ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වොතොත්) ඒවා අඩුකොට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන ඡේදය ප්‍රකාර අයකර ගැනීම සඳහා, මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන ඡේදයෙන් පැවරි ඇති බලතල ප්‍රකාර කෝට්ටේ, බැද්දගාන පාර, අංක 134 හි බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය වෙත බලය පවරා බලමුළුගැන්විය යුතු යැයි ද,

2. 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන ඡේදය ප්‍රකාර මෙම යෝජනා සම්මුතියේ දැන්වීම ප්‍රසිද්ධ කිරීමට බැංකුවේ ණය අයකරගැනීමේ ජ්‍යෙෂ්ඨ කළමණාකරු/ණයඅයකර ගැනීමේ ප්‍රධානී වෙත බලය පැවරිය යුතු යැයි ද,

3. 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන ඡේදය ප්‍රකාර මෙම යෝජනා සම්මුතියේ දැන්වීම ප්‍රසිද්ධ කිරීමට බැංකුවේ ණය අයකරගැනීමේ එකී කළමණාකරු/ණය අයකරගැනීමේ ප්‍රධානී විසින් එකී විකුණුම් නිවේදනය දැන්වීම් පළකලයුතු යයිද සහ එකී වෙන්දේසිකරුගෙන් උපදෙස් ලබා ගෙන තොරතුරු විමසා එකී විකුණුම් වෙන්දේසිය සඳහා දිනයක්, වේලාව සහ ස්ථානය නිශ්චය කිරීමට ණය අයකර ගැනීමේ එකී කළමණාකරු/ණය අයකරගැනීමේ ප්‍රධානී වෙත බලය පැවරිය යුතු යැයි ද,

4. 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 11 වන ඡේදය ප්‍රකාර බැංකුවේ සාමාන්‍ය අධිකාරි/ප්‍රධාන විධායක නිලධාරි හෝ බලයලත් නිලධාරියෙක් විසින් විකුණුම් වෙන්දේසි දිනට පෙර වහාම විරන්තික මිළ (වෙන්දේසියක පිළිගැනෙන අඩුම ලංසුව) නියම කළයුතු යැයි ද,

5. ඉහත සඳහන් පරිදි බැංකුවේ වන්දි හිමිකම් ඉල්ලීම, පිරිවැය සහ අනෙකුත් මුදල් හෝ විරන්තික මිළට වඩා වැඩි මිළක් ඉදිරිපත් කරන ලංසු කරුවෙක් නොමැති අවස්ථාවකදි නාමික මිළකට බැංකුව වෙනුවෙන් එකී දේපළ මිළදී ගැනීමට ලංසු ඉදිරිපත් කිරීමට, එකී විකිණීමේදී බැංකුව නියෝජනය කිරීමට ණය අයකරගැනීමේ එකී කළමණාකරු/ණය අයකර ගැනීමේ ප්‍රධානී හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු හෝ කොළඹ ශාඛා කළමනාකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු වෙත හෝ බලය පවරනු ලැබිය යුතු යැයි ද,

6. එවැනි වෙන්දේසි විකුණුමකින් අනතුරුව එකී පනතේ 15 වන ජේදය යටතේ විකුණුම් සහතිකය සම්පාදනය කළයුතු යැයිද, එවැනි විකුණුම් සහතිකය මුද්‍රා තබා, බැංකුවේ සමාගම් ව්‍යවස්ථාවට අනුකූලව බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක් හෝ ඕනෑම අධ්‍යක්ෂවරයකු හෝ ලේකම් විසින් එම විකුණුම් වෙන්දේසි සහතිකය එම මුද්‍රා තැබූ එවැනි විකුණුම් වෙන්දේසි සහතිකය සහතික කළයුතු යැයි ද,

වශයෙනි.

උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ මිරිස්ස පිහිටි "බොඩහේන්නැදිගේ කොරටුව *නොහොත්* පදිංචි ගෙදරවත්ත කැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. විජේවීර යන අය විසින් සාදන ලද 1992.03.20 දාතම හා අංක. 4353 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩමේ ලොට් 1A සහ රේන්දරාල විසින් හිමිකම් කියනු ලබන මෙම ඉඩමේ කොටසක්, නයිකලුගේ ජීවත් වන වත්ත, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් 1A සහ ගාල්ල මාතර ප්‍රධාන පාර, දකුණට : මෙම ඉඩමේ කොටසක්, බස්නාහිරට : පලුවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකයි දශම හතයි පහක් (අ. 0, රූ. 1, පර්. 1.75) විශාල ඉඩම් කොටස සමග පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක. 4353 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව **D** 1028/91 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

කළමණාකරු - අයකරගැනීම්.

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව,
අංක. 80 නාවල පාර,
නුගේගොඩ.

11 - 667